**කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

**අධ්‍යාපන පීඨය**

**අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය (III) කොටස - ප්‍රථම සෙමෙස්තරය - 2020/21**

**CTP 407 - විෂයමාලා න්‍යාය හා ක්‍රියාවලිය**

**පැය තුනයි (03)**

(අ) කොටසෙහි ප්‍රශ්න සියල්ලටම සහ

(ආ) කොටසෙහි ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

---

## අ - කොටස

සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. i. විධිමත් පාසලේ ක්‍රියාත්මක වන සිරස් විෂයමාලාවකට ද තිරස් විෂයමාලාවකට ද උදාහරණ දෙක බැගින් අනුපිළිවෙලින් ලියන්න.

(ලකුණු 04)

ii. පාසල තුළ ක්‍රියාත්මක සැඟවුණු විෂයමාලාවෙහි ස්වභාවය කෙටියෙන් හඳුන්වන්න.

(ලකුණු 04)

iii. විෂය සමගාමී ක්‍රියාකාරකම් යනුවෙන් හඳුන්වන්නේ කුමක්දැයි දක්වන්න.

(ලකුණු 04)

iv. විෂයමාලා සංවර්ධන ක්‍රියාවලියක පිරිසැලසුම්කරණ මූලිකාංග දක්වන්න.

(ලකුණු 04)

v. ශිෂ්‍ය කේන්ද්‍රීය විෂයමාලාවක මූලික ලක්ෂණ දක්වන්න.

(ලකුණු 04)

## ආ - කොටස

2. (i) විෂයමාලාව යන්න ප්‍රකාශිත නිර්වචන දෙකක් (2ක්) ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ii) වර්තමාන පාසල් විෂයමාලාව කෙරෙහි එල්ල වී ඇති අභියෝග පහක්(5) සඳහන් කර ඉන් අභියෝග දෙකක් (2ක්) සඳහා ගෙන ඇති විසඳුම් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

3. (i) විෂයමාලා සංවිධානයේදී භාවිත කරන අරමුණු ආකෘති තුනක් (3ක්) සඳහා උදාහරණ දක්වා වඩාත් සවිස්තරාත්මක ස්වරූපයක් ප්‍රදර්ශනය කරන ආකෘතියක් විස්තර කරන්න.

(ලකුණු 10)

(ii) අරමුණු ආකෘතිවලට අනුව විෂයමාලා සම්පාදනය කිරීමෙන් අත්වන වාසිදායක තත්ව පහක් (5 ක්) පැහැදිළි කරන්න.

(ලකුණු 10)

4. පහත මාතෘකා අතුරින් දෙකක් (2 ක්) පිළිබඳ කෙටි සටහන් ලියන්න.

අ. විෂයමාලා න්‍යාය හෙවත් සංකල්ප

ආ. ඩෙනිස් ලෝටන්ගේ ආකෘතිය

ඇ. විෂයමාලා පිරිසැලසුම් / රටා

ඉ. පාසල් ඉගෙනුම් අත්දැකීම් සංවිධානයේ දී ගුරුවරයාගේ කාර්යභාරය

(ලකුණු 10 x 2 = 20)

5. (i) විෂය කරුණු තෝරා ගැනීමේ දී විෂයමාලා සම්පාදකවරුන් මුහුණ දෙන දුෂ්කරතා පහක් (5 ක්) කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 10)

(ii) විෂය කරුණු තෝරාගැනීමේ ප්‍රවේශ තුනක් (3 ක්) කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

6. (i) විෂයමාලාවක් සඳහා විෂය අන්තර්ගතය තේරීමේදී උපයෝගී කර ගන්නා නිර්ණායක පහක් (5ක්) කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ii) නිර්ණායක පාදකව විෂය කරුණු තෝරාගැනීමේ ඇති වැදගත්කම විෂයක උදාහරණ සමඟින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)